## පානදුර නගර සභාව

## කළුතර දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 04 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 09 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පානදුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල මූලධන ආධාර මුදල රු.2,001,906 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.2,496,759 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් ආදායම් හා වියදම් ගිණුමේ මූලධන ආධාර මුදල රු.494,853 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පසුගිය වර්ෂයේ ජර්නල් සටහන් 31 මගින් රු.255,769 ක් වූ වැරදි සටහනක් දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුමට හර කිරීමෙන් හා 2013 වර්ෂයේ දෙසැම්බර් මස රු.43,357 ක් වූ ණය වාරිකය එම ගිණුමට හර නොකිරීම හේතුවෙන් ණය ගිණුමේ ශේෂය රු.212,412 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සංශෝධිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව කර්මාන්ත ණයගැති බැර ශේෂය රු.247,426 ක් වන අතර එය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ගිණුමේ බැර ශේෂය රු.119,842,037 ක් වුවත් රු.120,049,054 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත අරමුදල් ගිණුමේ බැර ශේෂය රු.207,017 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) අවිනිශ්චිත ගිණුමේ රු.207,017 ක් වූ බැර ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් අත් හැරී තිබුණි.

1.3.2 **<u>ගෙවිය යුතු ගිණුම්</u>**

සමාලෝචිත වර්ෂය තුළ පළාත් නිශ්චිත ව්‍යාපෘති මුදල් ලැබීම් සමග එකතු කළ අගය මත බදු වශයෙන් රු.247,427 ක් ලැබී ඇතත් විගණිත දිනය වූ 2015 පෙබරවාරි 18 දින වන විටත් එය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

සමාලෝචිත වර්ෂය තුළදී කර්මාන්ත ණයගැති ගිණුමට හර කර තිබූ රු.11,968,569 ක මුදලට අදාලව කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

1.3.4 **<u>නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්</u>**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) **<u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u>**

(i) මුදල් රෙගුලාසි 371(අ) ප්‍රකාරව කිසියම් කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් මුදලක් එම කාර්යය නිමවූ වහාම පිය විය යුතු වුවද 1990 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබූ රු.1,110,064 ක් වූ අත්තිකාරම් මුදල් 2016 අප්‍රේල් 30 දින වන විටත් පියවා නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ චෙක්පත් සඳහා ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වුවත් රු.16,360 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක IAI/2002/02 ප්‍රකාරව පරිගනක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යායුතු වුවත් 2015 වර්ෂය තුළ මිලදී ගත් රු.588,000 ක් වටිනා පරිගනක කට්ටල 3 ක වටිනාකම් සටහන් කර නොතිබුණි.

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.31,428,682 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.48,363,261 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.10,820,361 ක් වූ හිඟ ආදායම් නගර සභා ආඥා පනතේ (255) අධිකාරියේ 160, 165, 170 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

### 2.2.2 වරිපනම් බදු

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම රු.40,122,329 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට ඉන් රු.24,049,421 ක් හෙවත් සියයට 59.9 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය වූ රු.27,948,654 න් රු.18,002,004 ක් හෙවත් සියයට 64.4 ක ප්‍රමාණයක් අයකර තිබූ අතර වර්ෂය අවසානයට මුළු හිඟය රු.26,019,557 ක් විය.

### 2.2.3 කඩකුලී

(අ) 2014 වර්ෂය හා ඊට පෙර වර්ෂවලට අදාල හිඟ ශේෂය වූ රු.708,687 ක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අංක 8 දරන මාලු වෙළඳසැලේ අනවසර වෙනත් බාහිර පුද්ගලයෙකු වෙළඳාම් කරන බව වාර්තා වී ඇතත් සභාව මගින් විගණිත දිනය වූ 2016 පෙබරවාරි 15 දින වන විටත් වෙළඳසැල පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 දැන්වීම් පුවරු ගාස්තු

(අ) 2015 වර්ෂයේදී සමීක්ෂණ මගින් හඳුනාගන්නා ලද දැන්වීම් පුවරු 41 කින් රු.588,849 ක් ලැබිය යුතු වුවත් විගණන දිනය වූ 2016 පෙබරවාරි 15 දින වන විටත් එම ආදායම අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමීක්ෂණ කර හඳුනාගන්නා ලද දැන්වීම් පුවරු 20 කට අදාලව දැන්වීම් පුවරුවේ ප්‍රමාණයන් හා අය කළ යුතු මුදල සමීක්ෂණ වාර්තාවේ සටහන් කර නොතිබුණි.

(ඇ) එම සමීක්ෂණ වාර්තා 61 ට අදාල තොරතුරු, දැන්වීම් පුවරු ආදායම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

### 2.2.5 මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 38,600,000 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) සභාවේ සේවයේ නියුතුව සිට මාරු වී ගොස් හා සේවය හැර ගොස් සිටි නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු.101,023 ක් වූ ණය ශේෂය 2016 පෙබරවාරි 15 දින තෙක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 පෙබරවාරි 24 දිනැති විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/2011 දරන චක්‍රලේඛයේ 4.1 වගන්තියට අනුව අනියම් හා තාවකාලික සේවකයින්ගේ දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලේකම් හා ගණකාධිකාරි වෙත එවීමට කටයුතු කළ යුතු වුවත් එසේ නොකොට සේවක අරමුදල වෙත ප්‍රමාද වී ප්‍රේෂණය කිරීම හේතුවෙන් රු.1,055,546 ක් අධිභාර වශයෙන් එම අරමුදලට ගෙවීමට සිදුවී තිබූ අතර විගණිත දිනය වූ 2016 පෙබරවාරි 18 දින වන විට එම අධිභාර අරමුදලින් රු.360,000 ක වාරික දෙකක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

3.2 **අවිධිමත් ගනුදෙනු**

(අ) ඇඟිලි සළකුණු යන්ත්‍රයේ සටහන් කිරීම් නිවැරදි පිටවීමේ වේලාවන් ලෙස සැළකූ කළ 2015 වර්ෂයේ මාස 03 කදී රාජකාරි වේලාවෙන් පසු පැය 2 කට අඩුවෙන් සැලසුම් කමිටු පවත්වා තිබූ දින ගණන 10 ක් වූ අතර ඒ සඳහා 2014 දෙසැම්බර් 15 දිනැති පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක LG/07/2004 දරන චක්‍රලේඛයේ 15 ඡේදය ප්‍රකාරව රු.45,900 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) 2010 සැප්තැම්බර් 09 දිනැති පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පළාත් පාලන ආයතන ප්‍රධානියෙකු නියෝජ්‍ය ප්‍රධානියෙකු හෝ සභිකයෙකු විදේශ පුහුණු වැඩසටහනක් සඳහා තෝරාගන්නේ නම් අදාල සංවිධානය හෝ විදේශ රාජ්‍යය හෝ විදේශ ආයතනය හෝ ඒ සඳහා වැය වන සියලු වියදම් සහ පහසුකම් දැරිය යුතු වුවද සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු 2015 පෙබරවාරි 07 සිට 13 දින දක්වා දින 07 ක වියට්නාම සංචාරය සඳහා ගුවන් ටිකට්පත් ගාස්තු සහ අනියම් දීමනා ලෙස රු.320,000 ක්ද, යැපීම් දීමනා ලෙස රු.56,700 ක්ද සභාව මගින් වැය කර තිබුණි.

3.3 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

(i) 2015 මුල් මාස 05 සඳහා මොරටුව මහ නගර සභාව විසින් කසල බැහැර කරලීම සිදු කර තිබූ අතර 2015 මැයි මාසය දක්වා ඒ සඳහා ගෙවා තිබූ මුළු මුදල රු.840,336 ක් පමණක් වූ අතර තවදුරටත් ගෙවිය යුතු රු.325,390 ක් සඳහා ඉල්ලුම් කර තිබුණි. ඒ අනුව මාසික සාමාන්‍ය ගෙවීම රු.233,145 ක් පමණක් විය.

සභා බල ප්‍රදේශයේ එකතු වන කසල බැහැර කරලීම සඳහා 2015 ජූලි 20 දින සිට මාස 06 ක කාලසීමාවක් සඳහා පෞද්ගලික ආයතනයක් සමග ගිවිසුමකට එළඹ තිබුණි.

පෞද්ගලික ආයතනය කසල බැහැර කරලූ මාස 03 කට ආසන්න කාලසීමාව සඳහා පමණක් ගෙවා තිබූ මුළු මුදල රු.7,266,000 ක් වූ අතර ඒ අනුව මාසික සාමාන්‍යය රු.2,422,000 ක් විය.මෙය මොරටුව නගර සභාව විසින් කසල බැහැර කරලූ කාලයේ අදාල වියදමේ මාසික සාමාන්‍යය මෙන් සියයට 939 ක ගුණයකින් ඉහල යාමකි. මෙය නගර සභාවක් වැනි ආයතනයකට එතරම් ආර්ථිකමය නොවන පිරිවැයක් බැව් විගණනයේ අදහසයි.

(ii) කසල හුවමාරු මධ්‍යස්ථානයට රැගෙන එන කසල ට්‍රැක්ටර් ගණන හෝ ප්‍රමාණය පිළිබඳ වාර්තා තබාගැනීමක් සිදු කර නොතිබුණි.

(iii) කසල බැහැර කරලනුයේ කුමණ ප්‍රදේශයකටද යන්න සභාව විසින් සොයා බලා නොතිබූ අතර මෙය පරිසරාත්මක වශයෙන් බලපෑම් ඇතිකරන්නක්ද විය හැකි වේ.

### 3.4 <u>මානව සම්පත් කළමනාකරණය</u>

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| | අනුමත | තථ්‍ය | ඌනතාවය |
|---|---|---|---|
| මාණ්ඩලික | 8 | 4 | 4 |
| ද්විතීය | 64 | 59 | 5 |
| කණිෂ්ඨ | 228 | 216 | 12 |
| | 300 | 279 | 21 |

## 4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය